**Master Tutoring**
"Your success is our satisfaction"

VCE
(Year 11 & 12)
"Helping Hands towards University"
English
Chemistry
Biology
Physics
Mathematics
(General Maths, Maths Methods, Specialist Maths)
Management
Accounting
Physiology, legal studies etc.
+
Year 6 to 10 (English, Maths, Science)

Special classes are available for Scholarship exams

Group & individual classes
(In Mill Park/Bundoora Institute)

Home Tutoring for all subjects
(all suburbs in Melbourne) also available

For more information :
Nihal Kodikara (B.Sc., M.Phil., MBA)
Contact: 0402474873 or 94041488
(Weekdays after 6PM, Weekends –Anytime)

E mail: mastertutoring@bigpond.com
Qualified, Experienced & committed Tutors in Melbourne

(5 full Scholarships per year are offered for children in families with financial hardship - Selection will be through Master Tutoring Management Team)

*"Honestly and genuinely helping our sons and daughters"*

GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial Law
- Sale of Business
- Conveyancing
- Powers of Attorney
- Wills & Estate Planning
- Migration Law

**Senanie Kurukularatne** LL.B
**Barrister & Solicitor**
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

T 03 8786 9682
F 03 8786 9681
M 0414 660 513
gateway5@bigpond.net.au
DX 30463 Berwick VIC 3806
PO Box 730 Berwick VIC 3806
17 Glenview Rise Berwick VIC 3806 Australia

# අනන්තය



ආචාර්ය
**වික්‍රමබාහු කරුණාරත්න**

ඒ අසිරිමත් මිනිසා උපන්නේ හිමාලය පාමුල පැරණි සමාජයක කුඩා රජයක් තුළ. ආර්ය වංශික ලෙස සැලකූ මේ මිනිසුන් තම ආර්ය වංශය ගැන ලොකුවට හිතපු අය. ඒ කාලයේදී ඉන්දියාවේ මේ සමාජ තුළ මිනිසුන් එකම වර්ගයක් හැටියට සැලකුවේ නැහැ. තම ඇදහිලි, විශ්වාසයන් මෙන්ම වර්ණය, හැඩරුව ආදිය අනුව වර්ගවලට බෙදිල තමයි මිනිසුන් ක්‍රියාත්මක වුණේ. ඉන්දියාව තුළ ආර්යයන් අතරත් භේදයක් තිබුණා. එක කොටසක් විශ්වාස කළේ ලෝකය ඒකීයවම පවතින දෙයක් හැටියට. ඒ අනුව ලොව තැනූ තැනැත්තාම එහි විනාශයටත් වගකිව යුතු හැටියටයි මොවුන් කල්පනා කළේ. මේ අනුව මැවුම්කරුම එය පවත්වාගෙන යාමටත් අවසානයේ එය විනාශයටත් හේතුවන බවයි. මේ අදහස මෝනෝස් ලෙස හඳුන්වපු නිසා එය පිළිගත් අයත් මිනිස් යන අදහසට ආ ලෙසට සලකන්න පුළුවන්. මීට වෙනස් ලෙස ආර්යයන් ගේ අනෙක් කොටස ලෝකය දෙකට වෙන් වූ දෙයක් හැටියට සැලකුවා. ද්විත්වයක් ලෙසටයි මැවුම්කරු දැක්කේ. ඒ අනුව හොඳ නරක දෙක වෙන් වූ බවට විශ්වාස කළා. මේ උදවිය හැඳින්වූයේ දේවෝ යන නමින්. මේ අනුව බැලුවහම මෝනෝ, දේවෝ ලෙසට වර්ග වුණේ දාර්ශනික බැලීම් දෙකක් හැටියට මිස වර්ණ භේදයක් හැටියට නෙවෙයි. පර්සියාවේ පමණක් නෙවෙයි ග්‍රීක රෝම ආදී රටවල පවා මෝනෝ අදහස පැතිරී තිබුණ නිසා ඒ පළාත්වල මිනිස් නමින් හැමෝම හඳුන්වන්න පටන් ගත්තා. පර්සියානු අධිරාජ්‍යයේ වැඩි බලය තිබුණේ ද්විත්වය ලෙසට ලෝකයේ පරම තත්ත්වය දැක්ක අයටයි. ඒත් පසු කාලයක පර්සියාව ග්‍රීක සමාජයට යට වුණ නිසා එදා තිබුණ මුළු ලෝකයම මිනිස් කියන ගණයට ඇතුළ් වුණා. ඒ වුණාත් මිනිසුන් හැමෝම එක වර්ගයක්මද කියන ප්‍රශ්නය මේ මිනිස් සමාජවල පැතිරුණ ප්‍රශ්නයක් වුණා.

මේ විදියට බෙදිල හිටිය සමාජයක තමා අසිරිමත් මිනිසා බිහි වුණේ. ඔහු බුද්ධිමත්. මේ බෙදුන සමාජය තුළ ඇති වෙනස්කම් තුළින්ම ඔහුට ලෝකයේ පරම ඇත්ත සොයන්න තද බලපෑමක් ආවා. ඒ බුද්ධි වේදනාවට අනෙක් හැම දෙයක්ම යට වුණා. සත්‍යය සෙවීමේ වේදනාවට නැත්නම් මෙහෙයුමට කිට්ටු කරන්න පුළුවන් වෙන කිසිම මෙහෙයුමක් නෑ. ඒ නිසා ඔහු හැමටම හොරා ඒ දිනවල පැතිරිල තිබුණ ශ්‍රමණ සමාජය තුළ ශ්‍රමණයෙක් හැටියට තොරතුරු හොයමින් කල් ගත කළා. ඔහුට පෙනුන එක දෙයක් තමා ඉහත සමාජය තුළ තිබුන ආර්ය, නාග, යක්ෂ හා ගාන්ධාර කියන බෙදීම් බොරු බෙදීමක් බව. මේ අය අතර වෙනස, අවබෝධයේ හා සිරිත් විරිත්වල වෙනස කියල ඔහුට මුල සිටම අවබෝධ වෙලා තිබුණේ. මේ උඩ ඔහුට අවශ්‍ය වුණා තිබුණ බලවත්ම රාජ්‍යයන්ට ගිහින් මේ මිනිස්කමේ බෙදීම් ගැන අවබෝධ කරගන්න. ඒ අනුව හැමටම කිට්ටු භාෂාවක් යොදා ගන්නටත් ඔහුට හැකියාව ලැබුණා. ඒ අනුව සංස්කෘත වෙනුවට පාලි යොදා ගත්තා.

ඊළඟට ඔහු දැක්ක දෙයක් තමයි අද්භූත දේවල් ගැන කාටත් තිබුණ භය. ඒ ගැන හොයන විට ඔහුට පෙනුණේ මේවා සියල්ලම මනස්ගාත බව. මනසින්ම හොර රහසේ පෙනෙන බොරු දේවල් මෙලෙසට මනස්ගාත ලෙසට පෙනන බව ඔහු වටහා ගත්තා. ඒ අනුව මිනිස් මොළය ඇත්තෙන් ඈත් කරන බලවේගය වටහා ගන්නට ඔහු උත්සාහ කළා.

ඔහුට පෙනුන සරලම දෙයක් තමයි, මේ ලෝකය තුළ විවිධ දේවල් තිබුණාත් මේ ද්‍රව්‍යමය ලෝකය තුළ තිබෙන්නේ තත්ත්වයන් හතරක් විතරයි කියල. ඝන තත්ත්වය, ඊළඟට දියර තත්ත්වය. ඊළඟට වායු තත්ත්වය. අන්තිමේදී ගින්දර තත්ත්වය. මේ තත්ත්වයන් හතර අඩංගු නොවන කිසිම දෙයක් මේ විශ්වය තුළ නැති බව ඔහුට පැහැදිලි වුණා. මේ තත්ත්වයන් සම්ප්‍රදාය අනුව යමින් ඔහු හැඳින්වූයේ පඨවි, ආපෝ, වායෝ, තේජෝ හැටියටයි. ඊළඟට ඔහුගේ විපස්සනා හා විබජ්ජ ක්‍රම වලින් තවදුරටත් දැනුම වැඩි කරගෙන විශ්වය ගැන පරම සත්‍යයත් සොයා ගත්තා. ඒ තමා මේ සතර භූත අවස්ථාවන් ඇති වෙන්නේ අනිත්‍යය නිසා බව. මේ හැම දෙයක්ම මතු වෙන්නේ අනිත්‍ය හෙවත් චලනයෙන්. ඒ චලනයට රීතියක් තියෙනවා. ඒ තමා උත්පාත, තිථි, භංග රීතිය. යම් ආකාරයක් මතු වෙනවා. පවතිනවා. විනාශ වෙනවා. මේ විදියටයි මේ විශ්වයම පවතින්-